# හරය

143, කිව් පාර, කොළඹ 02.

දුරකතන: 011 2430621 ෆැක්ස්: 011 2305963

ඊමේල්: nssp.lk@gmail.com වෙබ්අඩවිය: www.nssp.info


## ලෝක විනාශය

එංගල්ස් 'සොබා දහමේ දයලෙක්තිකය' කෘතිය තුළ මෙසේ පවසයි. "…..කෙසේ වුවද 'ඇති වන සැම දේ නැති වී යාමට සුදුසු ය'. අවුරුදු දශ ලක්ෂ ගණනක් ගෙවී යනු ඇත. පරම්පරා ලක්ෂ ගණනක් ඉපිද මිය යනු ඇත. එහෙත් ධ්‍රැව වලින් ඉදිරියට ඇදී එන අයිස් තව දුරටත් දියකර හැරීමට හිරුගේ කෙමෙන් අඩුවන උණුසුම ප්‍රමාණවත් නොවන කාලය අනුකම්පා විරහිත ලෙස එළැඹෙනු ඇත. එවිට මිනිස් වර්ගයා නිරක්ෂය අසලට වඩ වඩාත් රොක්වනු ඇත. අවසානයේ දී එහිද ජීවත්වීම සඳහා සෑහෙන තරම් තාපයක් තව දුරටත් ඔවුන්ට නොලැබෙනු ඇත. ක්‍රමයෙන් අවසාන ජීවේන්ද්‍රියද අතුරුදහන් වනු ඇත. එවිට චන්ද්‍රයා මෙන් නිවී ගිය සීතල ගෝලයක් බවට පත් වූ පෘතුවියද වඩ වඩාත් පටුවන කක්ෂයක් ඔස්සේ තමා මෙන්ම මරණාසන්නයේ පසුවන හිරු වටා සණ අඳුරේ බ්‍රමණය වනු ඇත. අවසානයේ දී මළ පෘතුවිය මළ හිරු තුළට ඇද වැටෙනු ඇත….."

ලෝක විනාශය ගැන 19 වන ශතවර්ෂයේ පැවැති මතය එසේ විස්තර කරන එංගල්ස් මේ මතවාදයන් ගොඩනගන විද්‍යාවේ දාර්ශණික සීමාවන් ගැන මෙසේ අවධාරණය කරයි. "…..ස්වාභාව ධර්මය පිළිබඳ සිය දෘෂ්ඨිය හැකිතාක් දුරට සංගත සමස්ථයක් බවට ගොඩනගන සහ එය නොමැතිව අද ඉතාමත් පටු අනුභූතිවාදියෙකුට පවා කිසිදු නිගමනයකට එළැඹිය නොහැකි, න්‍යායික ස්වභාව විද්‍යාවේ දී බොහෝ විට අපට අසම්පූර්ණ ලෙස දත්….. ඌණතා සහිත දැනුමේ අඩුපාඩුව මග හරවා ගැනීමට චින්තනයේ සංගතතාවය ආධාර කළ යුතුය. නූතන ස්වභාවික විද්‍යාවට, දර්ශණවාදයෙන් චලිතයේ නියාමයන් ගෙන ආ යුතුය….."

නමුත් ස්වාභාවික විද්‍යාවට අකාරගත අනුභූතිවාදයේත්, යාන්ත්‍රික භෞතිකවාදයේත් සීමා ඉක්මවා යෑමට තවමත් හැකි වී නැත. එයට හේතුව පවතින ධනපති නිෂ්පාදන විධිය අනුභූතිවාදයේත්, උපයෝගීතාවාදයේත් සීමා තුළ පිහිටන බැවින් එය ඉක්මවා යෑමට ස්වාභාවික විද්‍යා චින්තකයන්ට ඉඩක් නොවීමයි. මන්ද, එම චින්තනය තුළ හිඳිමින් ප්‍රාග්ධනයේ මූලික අවශ්‍යතාවය වන අතිරික්ත වටිනාකම් ශ්‍රමයෙන් හා ස්වභාවධර්මය වෙතින් සූරාකෑම වෙනුවෙන් ස්වභාවික විද්‍යාවේ ශක්තිය මෙහෙයවීම ඔවුන්ගේ ඉරණමව තිබෙන හෙයිනි. මාක්ස් කියා ඇති පරිදි පසේ සශ්‍රීකත්වය හා කම්කරුවන්ගේ ජීවන ශක්තිය එක හා සමානව ප්‍රාග්ධනය වෙනුවෙන් පරිත්‍යාග කිරීමට සිදුව තිබේ. එය "…..අතිරික්ත වටිනාකම් සොයා යන්නේ කුසගින්නේ පෙලෙන වෘකයකු සේය….." යි ද මාක්ස් කියා ඇත.

මේ තත්වය තුළ 19 වැනි ශතවර්ෂයේ ලෝක විනාශය පිළිබඳ විශ්ලේෂණය අද කණපිට හැරී ඇත. ඒ වෙනුවට විනාශය සිදුවන්නේ පෙර කී පරිදි ස්වභාවිකව නොව සොබාදහම ප්‍රාග්ධනයේ දඩබිමක් වීම නිසාය.

1. කාබන්ඩයොක්සයිඩ් මෝචනය ඉහළ යෑමෙන් වායුගෝලයේ උණුසුම ඉහළ යමින් ග්ලැශියර දිය වී මුහුදු මට්ටම ඉහල යයි. 2. භූමියේ වණ ආවරණය ඉවත් කිරීම නිසා කාන්තාරකරණය සිදුවෙයි. 3. පානීය ජල සම්පත අපිරිසිදු වන අතර ප්‍රමාණයෙන් අඩු වී යයි. 4.විෂකරණය තුළ ජීවීන් වර්ග වඳ වී යයි.

මේ තත්ත්වය බැරෑරුම් අයුරින් අප ඉදිරියේ මතු වී ඇත්තේ මෙක්සිකන් බොක්ක අසල අඩි 5000 ක් ගැඹුරු මුහුදේ පාෂාණ ආවරණය බිඳ තෙල් ගැනීමට යෑමේ දී ය. නූතන ස්වභාව විද්‍යාවේ දාර්ශණික පද්ධතියට පිංසිදුවෙන්නට සොබාදහමේ අන්තර්සබඳතා නොතකා ගනු ලැබූ මේ පියවර මගින් ගණනය කළ නොහැකි ද්‍රව පීඩණයක් දරා සිටි පාෂාණයක් සිදුරු කර තිබේ. ඒ අනුව අප්‍රේල් 20 දා සිට ඉන් පිටතට තෙල් විදින්නට ගත් පීඩනය දරා ගනිමින් ක්‍රමානුකූලව එකතු කර ගැනීමට සවිමත් යාන්ත්‍රණයක් විද්‍යාවට නැත.

ඒ අනුව අප්‍රේල් 20 දා සිට මෙයින් මුහුදට විදින තෙල් බැරල් ප්‍රමාණය දිනකට 5000 ලෙස ගණනය කෙරිණි. එම තක්සේරුව ජූනි මාසය මැද දී බැරල් 30,000 - 65,000 ක් ලෙස ප්‍රකාශ කළද, වාර්තා දක්වන්නේ මේ කටයුත්ත කළ බ්‍රිටිෂ් පැට්‍රෝලියම් සමාගමේ (BP) අභ්‍යන්තර තක්සේරුව දිනකට බැරල් 100,000 ක් වන බවයි. මේ පිපිරීමෙන් එදින කම්කරුවන් 20 දෙනෙක් මිය ගියේය. මුහුද තෙලින් වැසී යෑම නිසා ජූනි 23 වන විට ජලජ පක්ෂීන් 1024 ක් මිය ගිය අතර මත්ස්‍ය විනාශය ගණනය කළ නොහේ. එක්සත් ජනපදයේ මැක්සිකන් බොක්ක අසබඩ පිහිටි වනජීවී රක්ෂණ වනාන්තර 36 ක් තර්ජනයට ලක්ව ඇති අතර, එහි ලුසියානා ප්‍රාන්තය අසබඩ කිලෝ මීටර් 201 ක් දිගට හා කි.මී. 100 ක් පළලට වෙරළ දූෂණය වී ඇත.

නවතා ගැනීමට තවමත් ක්‍රමයක් නැති මේ තෙල් ගලනය නිමවන්නේ කවදාද නොදනී. මෙයින් ඉදිරියේ දී සිදුවන විනාශය ගැන තක්සේරුවක් කිරීමට සමතකු නැත. මෙයිනුදු අතිරික්ත වටිනාකම් සොයා සොබාදහම දඩයම් කරගෙන යන ප්‍රාග්ධනය යමක් ඉගෙන ගනීද? ඒ නම් සිතීමට වත් බැරිය. එය නවතිනු ඇත්තේ එක්කෝ සමාජවාදී පාලනයක් තුළය. නැත්නම් ලෝකය විනාශ කිරීමෙන් පසුවය.

# විපක්ෂයේ හුළං බැස්සේ ඇයි?

මේ වෙලාවේ හුඟ දෙනෙකුට ලොකු ප්‍රශ්නයක් තියෙනවා විරුද්ධ පක්ෂයට මොකද වෙලා තියෙන්නේ කියලා. කාටත් පෙනෙන දෙයක් තමයි එක්සත් ජාතික පක්ෂය තුළත් අර්බුදයක් තියෙන බව. ඒ එක්කම එක්සත් ජාතික පක්ෂය සමඟ හිටපු මනෝ ගනේශන්, මුස්ලිම් කොංග්‍රසය වැනි සංවිධාන අතරත් අර්බුදයක් තියෙනවා. ඒ අතර ජනතා විමුක්ති පෙරමුණ සහ සරත් ෆොන්සේකා අතරත් ගැටුමක් තියෙන බව පෙනෙනවා. මේ නිසා ජනතාව පොදුවේ මුහුණ දෙන ප්‍රශ්නවලදී විපක්ෂයේ ක්‍රියාමාර්ග මොනවද කියලා ජනතාව තුළ ප්‍රශ්නයක් මතු වෙලා තියෙනවා.

අනෙක් පැත්තෙන් ඉතාමත්ම දක්ෂිණාංශික වැඩපිළිවෙලකට රජය ගමන් කරමින් සිටිනවා. ව්‍යවස්ථාමය පැත්තෙන් බැලුවොත් දිගටම ඒකාධිපති ලෙස බලයේ සිටීමට ව්‍යවස්ථාව වෙනස් කිරීමට විශාල උත්සාහයක් ආණ්ඩුව ගෙන යන බව පෙනෙනවා. විශාල ලෙස මුදල් වෙන් කරමින් හමුදාව පළල් කිරීමට විශාල වැඩපිළිවෙලක් ඇති බවත් පෙනෙනවා. ඒ සමඟම 13 වන ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කර වෙනත් සංශෝධන ගෙන ඒමට හදනවා. තවමත් හදිසි නීතිය, PTA ක්‍රියාත්මක කරනවා. මේ විදියට බැලුවොත් පෙනෙනවා සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදය ලොකු අනතුරකට මුහුණ පා ඇති බව.

ගෝලීය බලවතුන්ගේ මැදිහත්වීම පැත්තෙන් බැලුවොත් පෙනෙනවා ආණ්ඩුව ඉතා තදින් IMF කොන්දේසි ක්‍රියාත්මක කිරීමට සූදානම් වී සිටින බව. ඔවුන් ඉදිරියේ දණ ගසමින් ඔවුන්ගෙන් යමක් ගන්න බලනවා. ඉන්දියාවේ ''සීපා ගිවිසුම''ට එකඟව, ගෝලීය බලවතුන්ට යටත් වන ස්වභාවයක් තියෙනවා. මේ නිසා මේක නිදහස් රටක්ද කියන ප්‍රශ්නය මතුව තිබෙනවා.

ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් ගත්තද, විශාල විනාශයක් කර එයින් ගොඩ ඒමට නොහැකි තත්ත්වයකයි ආණ්ඩුව ඉන්නේ. ඒ සඳහා කිසිම විසඳුමක් ඇති බවක් පෙනෙන්නටවත් නෑ. මෙතුවක් ක්‍රියාත්මක වූ පළාත් සභා පවා කඩාකප්පල් කර වෙනත් ආකාරයකට ක්‍රියාත්මක වීමක් තමයි අද වෙන කොට තියෙන්නේ. සාමාන්‍ය ජනතාවට ප්‍රදේශගත බලයක් ඇති කරගැනීම, අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම, ගොවීන්ගේ ඉඩම් ආරක්ෂා කරගැනීම ආදී දේවල් සම්බන්ධයෙන් මාවතක් නැති බවයි පෙනෙන්නේ. මේ නිසා ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් සහ සුළු ජාතීන් සම්බන්ධයෙන් විශාල ගැටළුවක් මතු වී තියෙනවා.

ඒත් සමඟ සාමාන්‍ය ජනතාවද බලවත් ලෙස පීඩාවට පත් කරමින් සිටිනවා. අනවසරයෝ කියා ගොවීන්, ධීවරයින් ඇතුළු සාමාන්‍ය මිනිසුන් තමන්ගේ භූමිවලින් එළවනවා. තම ප්‍රදේශයේ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා වන ප්‍රදේශීය සභාව වැනි ආයතනයක් හෝ ක්‍රියාකාරී නැති තත්ත්වයක් උදා කර තිබෙන්නේ.

උතුරු නැගෙනහිරද බොහෝ ඉඩම් බලෙන් අල්ලාගෙන තියෙන්නේ. ඒ වගේම දකුණේත් ජනතාවගේ දේපොල උදුරා ගනිමිනුයි සිටින්නේ. පෙර කාලවලදී මේ ආකාරයෙන් ජනතාවගේ දේ උදුරාගැනීම යූඑන්පී දක්ෂිණාංශික වැඩක් හැටියටයි සැලකුවේ. නමුත් දැන් ඊටත් වඩා දක්ෂිණාංශික පියවරයන් ගන්නා තත්ත්වයකුයි මේ ආණ්ඩුව යටතේ තියෙන්නේ.

මෙවැනි තත්ත්වයක් තිබෙද්දීත් ඇයි ජනතාව නැගිටින්නෙ නැත්තේ? එහෙම නැත්නම් මේ හැම ප්‍රශ්නයකටම වෙනත් විසඳුමක් තිබෙනවාද? මේ ගෝලීය බලවතුන්ගේ ආර්ථික කොන්දේසිවලට නොනැමී යන්නට ගමන් මඟක් තිබෙනවාද? එහෙම ඇතැයි සිතන විපක්ෂ නායකයෝ කවුරුද? එජාපය හෝ සරත් ෆොන්සේකාට එවන් අදහසක් තිබෙනවාද? ජෙනරල් ෆොන්සේකාගෙන් තොර වූ ආර්ථික ගමනක් මේ අවස්ථාවේ ජවිපෙට තිබෙනවාද? ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන්ද ඔවුන් සලකනුයේ එහෙම ප්‍රශ්නයක් නැති බවයි. අවතැන් වූවන් නැවත පදිංචි කර, කෑමබීම සැලසුවාම ප්‍රශ්නය ඉවර බවයි ඔවුන් කියන්නේ.

එහෙත් ඉන්දියාවෙන් බලය බෙදීම සඳහා බලපෑමක් ඇති නිසා මේ ගැන සලකා බැලීමක් කරන බවක් පෙන්වූවද, ඒ සඳහා පිළිතුරක් ඉදිරිපත් කිරීමටවත් මේ අයට හැකියාවක් නැහැ. ලංකාවේ දෙමළ ජාතියක් ඉන්නා බවට වත් කතාවක් දැන් නැහැ. ඒ නිසා බලය බෙදීමක් ගැන කථා කිරීමට ඉඩක් ඇත්තේම නැහැ. මෙහි ජාතික ප්‍රශ්නයක් නැහැ, දෙමළුන්ට ප්‍රශ්නයක් තියෙනවා යනුවෙන් අදහස් කරන බවකුයි පෙනෙන්නේ. මේ සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයද කිසි දෙයක් කථා කරන්නේ නැහැ. සජිත් ප්‍රේමදාස එජාපයේ නායකත්වයට ගෙන ඒමට කටයුතු කරමින් සිටියත් එයාත් මහින්ද රාජපක්ෂ කරපු දේ පිළිගන්න කෙනෙක්. ෆොන්සේකා ද කියන්නේ අවතැන් වූවන් පදිංචි කිරීම ගැන පමණයි. ජේවීපියටද මේ සඳහා කිසිම විසඳුමක් නැහැ.



ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න විසින් ඔස්වින් පාසලේ පවත්වන ලද "විපක්ෂයේ අර්බුදය" දේශනය ඇසුරින් සකස් කරන ලදි.

දැන් ව්‍යවස්ථා වෙනස් කිරීමක් කථා කරනවා. මේ ආණ්ඩුව ආවේම මේ ඒකාධිපති ව්‍යවස්ථාව වෙනස් කිරීම හා බලතල සහිත පාර්ලිමේන්තුවක් සෑදීම ගැන කථා කරමින්. එජාපයද ජනාධිපති බලය වෙනස් කිරීම ගැන කථා කරන්නේ නැහැ. ජෙවීපිය දිගටම විධායක ජනාධිපති බලයට එරෙහිව පෙනී සිටි බව පැවැසුවත්, ෆොන්සේකා කුමන තැනක ඉන්නවාදැයි නොදන්නා නිසා මෙයද ගැටළුවක්.

ඒ සමඟම ගැමි ගොවි ජනතාවගේ ප්‍රශ්නයට කොහොමද විසඳුමක් දෙන්නේ. ඒ ඒ ප්‍රදේශවල ජනතාවට බලය දීල තම ප්‍රදේශවල ඉඩකඩම් සංවර්ධනය කරගැනීමේ වැඩපිළිවෙලකට යනවාද. ඒ විදියට ඉඩම් බලය ලබා දෙනවාද? ධීවරයන්ට මුහුදේ බලයක් ලබා දෙනවාද? මේ ගැන කිසිම සාකච්ඡාවක් නැහැ. මේ ආණ්ඩුවට විපක්ෂය විරුද්ධ වෙන්නේ කුමන පදනමකින්ද? මෙය විශාල ගැටළුවක්. මේ පවතින තත්ත්වය තුළ ඉතාම පැහැදිලි රැඩිකල් වැඩපිළිවෙලක් තිබිය යුතුයි මෙයට එරෙහිව යනවා නම්. රජයට එරෙහිව විකල්ප යෝජනාවක් නොමැති වීම බාධාවක් වී තිබෙනෙවා විරුදධ පක්ෂ ලෙස ඒකාරාශීවීමට.

ඒ වගේම ගෝලීය බලවතුන්ගේ ආර්ථික සම්ප්‍රදාය ඉදිරියට ගෙන යන අදහස, ඉන්දියාවද ඉදිරියට ගිය මේ සම්ප්‍රදාය අපි පිළිගත යුතුයි කියන අදහස, WB, IMF ගිවිසුම් වඩා සාරවත් කරගැනීම යන එජාපයේ සහ ෆොන්සේකා ගේ අදහස අපට කොහෙත්ම පිළිගැනීමට බැහැ. මෙම සංවර්ධනය ඉතා කුඩා පිරිසකට සංවර්ධනයක් වූවාට ඉතා විශාල පිරිසකට ඛේදවාචකයක්. අපි විතරක් නෙවෙයි හියුගෝ චාවේස් ඇතුළු ලතින් ඇමරිකාවේ බොහෝ රටවල නායකයින් කියන්නේත් මේකමයි. ඇමරිකාවේ සමාගම් ඇමරිකාව ආසන්නයේ තිබෙන රටවලට සංවර්ධනයක් අත් කර දෙනවා නම් ලතින් ඇමරිකානු රටවල අය ඒ තරම් විරුද්ධ ඇයි? ඒකේ තේරුම එහෙම සංවර්ධනයක් සිද්ධ වෙන්නේ නැහැ, මංකොල්ලයකුයි සිද්ධ වෙන්නේ කියලා ඔවුන් දන්න නිසා.

ඉන්දියාව ඇතුළු ගෝලීය බලවතුන්ට එරෙහිව හා උතුරු නැගෙනහිර දෙමළ ජාතියට බලයක් දීමට කැමැතිද යන මූලික කාරණා දෙක සම්බන්ධයෙන් යම්කිසි උද්ඝෝෂණයක් කිරීමට හැකියාව තිබෙනවා නම් යම් ප්‍රතිඵලයක්ද ගත හැකියි. උතුරු නැගෙනහිර දෙමළ ජනතාවගේ ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් විශේෂත්වයක් තිබිය යුතුයි. කොළඹ, වතුකරයේ හෝ වෙනත් තැනක ජීවත් වන දෙමළ ජනයාට ජාතික ප්‍රශ්නයක් නෑ. ඔවුනට අවශ්‍ය සමානාත්මකව සැලකීම. වතුකරයට අවශ්‍ය ඉඩම් ලබා දීම. ඒක ජාතික ගැටළුවක් නෙවෙයි. මේ ආකාරයට අනෙක් දෙමළ පිරිස්වල සමානාත්මතාවය ගැන ප්‍රශ්න විසඳිය යුතුයි. එහෙත් උතුරු නැගෙනහිර ජනතාවට බලය බෙදීමේ දේශපාලන විසඳුමක් දිය යුතුයි. මේ ප්‍රශ්න දෙකට රැඩිකල් විසඳුම් නොසොයන්නේ නම් විරුද්ධ පක්ෂයකින් වැඩක් නැහැ. ඇත්තටම විරුද්ධ පක්ෂයක් ඇති වන්නේද නැහැ.

ඒ නිසා සංවර්ධනය හා නිදහස සම්බන්ධයෙන් අපට වෙනම ප්‍රතිපත්තියක් තියෙනවා කියන කරුණු දෙක හැරුණ විට මේ ආණ්ඩුවට විරුද්ධ බවක් පෙන්වන්න මේ අයට බැහැ. යූඑන්පිය කරන්න හදපු, කරන්න සැලසුම් කළ සියල්ල මේ ආණ්ඩුව කරනවා. ඒ නිසා යූඑන්පීය මෙම ආණ්ඩුවට විරුද්ධයි කියන එක බොරුවක්. ෆොන්සේකා මහත්තයාගේ තත්ත්වයත් ඒකමයි. එයාට කියන්න තියෙන්නේ මේකේ වීරයා මම කියලා විතරයි. වෙනත් වෙනස් දෙයක් කියන්න එයාටත් නැහැ.

මේ ආණ්ඩුව ගෙනියනවා ශකිත්මත් වැඩපිළිවෙලක්. ඒකට ලෝකයේම පක්ෂපාතිත්වයක්, උදව්වක් තියෙනවා. විරුද්ධ මතයක් දරණ බලවත් කවුරුත් නෑ. මේක තමයි අද විපක්ෂයේ අර්බුදය.